මදුරාවල ප්‍රාදේශීය සභාව
කළුතර දිස්ත්‍රික්කය
--------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින සභාපතිවරයාට යවා ඇත.

1:2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මදුරාවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් රු.27,039 ක් වටිනා ජල ටැංකි 3 ක් හා රු.252,554 ක් වටිනා අභ්‍යන්තර දුරකථන පද්ධතිය සඳහා දරන ලද මුදල ප්‍රාග්ධනිත කර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම් රු.279,593 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ලීබඩු හා කාර්යාල උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල රු.247,152 ක් වුවත්, රු.214,915 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ලී බඩු හා කාර්යාල උපකරණ සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම් රු.32,237 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ළමා උද්‍යානයේ ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම සඳහා ණයහිමි ලෙස රු.1,925,077 ක මුදලක් වෙන්කර තිබුණද, ඉන් රු.1,262,037 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් රු.663,040 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ නාර්තුපාන සතිපොළ ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.3,986,481 ක වියදම ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ඉඩම් ගොඩනැගිලි හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම වෙනුවෙන් දරන ලද රු.1,919,489 ක වියදම පුනරාවර්තන වැය යටතේ දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ලී බඩු හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් දැරූ රු.174,124 ක වියදම පුනරාවර්තන වැය යටතේ දක්වා තිබීම හේතුවෙන් ප්‍රාග්ධන වැය රු.174,124 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ශේෂයක් ලෙස රු.221,804 ක මුදලක් ජංගම වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ නමුත් බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ 2017 මූල්‍ය ප්‍රකාශනවල මදුරාවල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ශේෂයක් ලෙස රු.331,130 ක මුදලක් දක්වා තිබුණි. කෙසේ වුවත් 2006 වර්ෂයේ බුලත්සිංහල හා මදුරාවල වත්කම් බෙදීමට අනුව මදුරාවල ප්‍රාදේශීය සභාවට

ලැබිය යුතු ශේෂය රු.3,453,309 ක් බව සභාපතිවරයාගේ 2018 ජුලි 17 දිනැති ලිපිය මගින් දන්වා තිබුණි.

(ආ) බුලත්සිංහල ප්‍රාදේශීය සභාවෙන් කොටසක් 2006 අප්‍රේල් 15 දින මදුරාවල ප්‍රාදේශීය සභාව ලෙස වෙන්කර දී තිබුණද එම අවස්ථාවේදී සභාවට හිමිවිය යුතු වත්කම් හා වගකීම් 2018 ජූලි 30 දින වන විටත් නිරවුල් කර ගෙන නොතිබුණි.

1:3:3 <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>

විධිමත්ව පැවැත්වූ ස්ථාවර වත්කම් ලේඛනය හා අදාළ උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.83,883,306 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය / සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 <u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | |
| (i) 134(i) වගන්තිය | ---- | දියුණුකළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ යම් නිශ්චල දේපලක් හෝ නිශ්චල දේපල සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 160 වගන්තිය | ---- | හිඟ වරිපනම් බදු අයකරගැනීමේ අවසන් පියවර ලෙසට දේපල තහනම් කිරීම් කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 218 | 73,229,868 | සභාව සතු සියලු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104(3)(4) | ---- | සභාවේ ඩබල් කැබ් රථයක් 2016 දෙසැම්බර් 31 දින අනතුරකට ලක් වී තිබුණද පරීක්ෂණයක් සිදු කර ප්‍රාරම්භක හා අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | ---- | සභා වාහන වල ඉන්ධන දැවීම් පරීක්ෂා කර නොතිබුණි. |
| (ඉ) 1988 මැයි 17 දිනැති අංක 1988 /22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | ---- | වරිපනම්වලට යටත් දේපල අවුරුදු 5 කට වරක් තක්සේරු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2:1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,937,048 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,632,480 ක් විය.

2:2 <u>ආදායම් පරිපාලනය</u>

2:2:1 <u>ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 1,241,650 | 1,017,903 | 835,226 | 360,549 | 1,495,960 | 588,408 | 439,695 | 764,547 |
| (ii)බලපත්‍ර ගාස්තු | 325,850 | 1,103,332 | 956,665 | 146,666 | 307,220 | 664,160 | 664,160 | - |
| (iii)වෙනත් ආදායම් | 10,836,200 | 10,000,000 | - | 17,255,583 | 9,600,200 | 8,500,000 | - | 9,273,514 |

2.2.2 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

(අ) <u>වරිපනම් හා බදු</u>

(i) සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් බදු හිඟය රු.543,217 ක් වූ අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.369,049 ක් හෙවත් සියයට 68 ක් අයකරගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ වරිපනම් ආදායම රු.539,992 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ඉන් රු.504,452 ක් හෙවත් සියයට 93 ක් අයකරගෙන තිබුණි.

(iii) 2017 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු හිඟ වරිපනම් ශේෂය රු.209,708 ක් වූ අතර ඉන් රු.174,168 ක්ම වසරකට වඩා වැඩි හිඟ ශේෂ වූ අතර ප්‍රාදේශීය සභා පනතේ 161 වගන්තිය අනුව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) <u>අක්කර බදු</u>

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ අක්කර බදු ශේෂය රු.11,439 ක් වූ අතර වාර්ෂික බිල් කිරිම රු.13,998 ක් විය. වර්ෂය තුලදී රු.19,349 ක් අය කර තිබූ අතර වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.4,212 ක් විය.

(ඇ) <u>ජල බදු</u>

සමාලෝචිත වර්ෂයේ ජල බදු ආදායම වශයෙන් රු.463,911 ක් බිල් කර තිබූ අතර ඉන් රු.317,245 ක් හෙවත් සියයට 68 ක ප්‍රමාණයක් අයකර තිබූ බැවින් වර්ෂය අවසානයට හිඟය රු.146,666ක් විය.

**2.2.3** <u>**බලපත්‍ර ගාස්තු**</u>

කර්මාන්ත බදු/ ව්‍යාපාර බදු/ වෙළඳ බලපත්‍ර ආදායම් අයකිරීම සඳහා වාර්ෂික සමීක්ෂණයක් සිදු කර ඒ අනුව බිල් කිරීම් කර අදාල පුද්ගලයින්ගෙන් බදු මුදල් අය කළ යුතු වුවත් බදු මුදල් ලෙස ලැබෙන ආදායම වර්ෂයේ බිල්කිරීම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

2.2.4 <u>**උසාවි දඩ හා මුද්දර ගාස්තු**</u>

(අ) <u>උසාවි දඩ</u>

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟහිටි උසාවි දඩ මුදල රු.4,397,583 ක් වූ අතර එම හිඟ ශේෂයෙන් වර්ෂය තුළ කිසිදු මුදලක් ලැබී නොතිබුණි. වර්ෂය තුළදී උසාවි දඩ රු.500,000 ක් බිල්කර තිබුණු අතර, 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.4,897,583 ක් විය. තවද, සෑම වර්ෂයකම උසාවි දඩ අධි බිල්කිරීමක් කර තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) <u>මුද්දර ගාස්තු</u>

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟහිටි මුද්දර ගාස්තු මුදල රු.4,875,932 ක් වූ අතර එම ශේෂයට පෙර වර්ෂවලට අදාලව අඩුවෙන් බිල්කිරීම් වශයෙන් රු.6,082,043 ක් වර්ෂය තුළ එකතුකර තිබුණි. එම හිඟයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.8,099,975 ක් ලැබී තිබූ අතර වර්ෂයට අදාල බිල් කිරිම රු.9,500,000 ක් විය. ඒ අනුව 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.12,358,000 ක් විය.

3. <u>**මෙහෙයුම් සමාලෝචනය**</u>

3.1 <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරිම, ජනතාවගේ සුබ විහරණය, පහසුව සහ සුභ සාධනය යන සභාව විසින් ඉටු කලයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරිම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබු නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 12 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) <u>ක්‍රියාකාරි සැලැස්ම</u>

පනවා තිබු අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කල යුතුව තිබූ කර්තව්‍යයන් 02 ක් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) <u>ප්‍රතිපාදන සැලසීම</u>

පිළියෙල කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව වාර්ෂික අයවැය ලේඛනය සකස්කර නොතිබුණි.

(ඈ) <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් 2015, 2016 හා 2017 යන වර්ෂවල පිළිවෙලින් රු.1,533,900 ක්, රු.1,504,053 හා රු.1,863,094 ක වියදමක් දරා තිබූ අතර දිරන කසළ සඳහා කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. සභා බල ප්‍රදේශයේ කසළ රැස් කිරීම කලාප දෙකකට බෙදා තිබූ අතර එම කලාප වල කසළ බදු අය කළ යුතු ආයතනවලින් කසළ බදු අය කර නොතිබුණි.

(ඉ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සභාව දැනුවත් වී නොතිබුණි.

3:2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) <u>ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම</u>

2006 අප්‍රේල් 15 දින සිට ප්‍රාදේශීය සභාව ස්ථාපිත කර එවකට බුලත්සිංහල ප්‍රාදේශීය සභාව සතුව තිබුණු වත්කම් හා වගකීම් බුලත්සිංහල සහ මදුරාවල ප්‍රාදේශීය සභා වෙනුවෙන් වෙන්කොට තිබුණද 2018 අප්‍රේල් 05 විගණන දින වන විටත් එම වත්කම් හා වගකීම් නීත්‍යානුකූලව බෙදී නොතිබුණි. මදුරාවල ප්‍රාදේශීය සභාව ආරම්භයේදී දැනට පවත්නා සභා ඉඩම හා ගොඩනැගිල්ල ඇතුළු සුසානභූමි වෙනත් ඉඩම් හා ගොඩනැගිලි ලබාදී තිබුණද, ආරම්භක ශේෂ පත්‍රයේ ඉඩම් හා ගොඩනැගිලි කිසිවක් දක්වා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය කර ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) <u>විදුලි උපකරණ සවි කිරීම</u>

(i) විදුලි අංශය විසින් වීථි පහන් කණු සඳහා විදුලි බල්බ සවි කිරීමේදී දෛනිකව සවිකරන ලද බල්බ පිළිබඳ සටහන් ලේඛනයක් පවත්වා ගෙන නොයෑම හේතුවෙන් ගබඩාවෙන් ලබා ගන්නා බල්බ කොපමණ සවිකරන ලද්දේද හා ඉතිරිය කොපමණද යන්න තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) කණුවලින් ගලවන ලද වගකීමක් සහිත හා රහිත බල්බ විදුලි කාර්මික විසින් ගබඩාවට භාර දීමේදී ලේඛනගත කිරීමක් සිදු කර නොතිබුණි. එබැවින් වගකීම්කාලය ඉකුත් නොවූ බල්බ සඳහා වෙනත් බල්බ ලබාගැනීමට නොහැකි වී තිබුණි.

3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ) <u>පුරප්පාඩු හා අතිරික්ත</u>

(i) පුරප්පාඩුව පැවති ලේකම් තනතුරේ වැඩ ආවරණය සඳහා කළමනාකරණ සහකාර 1 ශ්‍රේණියේ නිලධාරිනියක පත්කර තිබුණි.

(ii) ප්‍රාථමික මට්ටමේ සේවකයින් 04 දෙනෙකු අතිරික්තව සිටියදී අනියම් ආදේශක වශයෙන් සේවකයින් 09 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ආ) <u>සේවක ණය</u>

සේවය හැරගිය, ස්ථාන මාරුවී ගිය, මියගිය හා බන්ධනාගාර ගත වූ නිලධාරීන් 6 දෙනෙකුගෙන් වර්ෂ 1 සිට 7 දක්වා වූ කාලයක සිට අය නොවී පැවත එන එකතුව රු.99,800 ක ණය ශේෂයක් පැවතුණි.

ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 වත්කම් කළමණාකරණය

3.4.1 සභා බල ප්‍රදේශයේ සුසාන භූමි ආරක්ෂාව

සභා බල ප්‍රදේශය තුළ හඳුනාගත් සුසාන භූමි 24 ක් පවතින බව අනාවරණය වූ අතර ඒ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) සුසාන භූමි 13 ක් සම්බන්ධයෙන් මැනුම් කටයුතු කර නොතිබුණි.

(ආ) සුසාන භූමි 6 ක් සම්බන්ධයෙන් පවරා දීමට කටයුතු කරන ලෙස පළාත් ඉඩම් කොමසාරිස් වෙත ඉල්ලීම් කර ඇතත් 2018 මැයි 31 දින වන විටත් පවරා දී නොතිබුණි.

(ඇ) 636 කුඩායාල, මාබෝගොඩ, තුත්තිරිපිටිය අක්කර 2 ක් පමණ වූ පොදු සුසාන භූමිය තුළ අනවසරයෙන් වගා කිරීම් කෙරීගෙන යන බව හා 633 වේරවත්ත, දෙල්ගහ කන්ද සුසාන භූමියෙන් අක්කරයක පමණ ඉඩම් කොටසක් අනවසර අල්ලා ගැනීම් සිදුවී ඇති බවට පැමිණිලි ලැබී තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.4.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

(අ) දික්ලන්ද ජල ව්‍යාපෘතිය

පුර නැගුම ව්‍යාපෘතිය යටතේ නිවාස 21 කට ජලය ලබාදීම වෙනුවෙන් රු.6,604,411 ක මුදලක් වැය කර මෙම ජල ව්‍යාපෘතිය 2016 ඔක්තෝබර් 10 දින සභාවට භාරදී තිබුණත්, ඉදිකර තිබුණු ලිදේ ජලයෙහි අහිතකර බැක්ටීරියා තත්ත්වයක් නිසා ජලය ප්‍රයෝජනයට නුසුදුසු වීමෙන් මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම නිශ්කාර්යය වියදමක් වී තිබුණි.

(ආ) රෙමුණ (අක්කර 90) ජල ව්‍යාපෘතිය

පවුල් 74 කට ජලය ලබාදීමේ අරමුණින් රු.17,800,877 ක මුදලක් වැය කර ආරම්භ කර තිබූ මෙම ජල ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව 52 පමණක් වීමෙන් මෙම ව්‍යාපෘතියද ඌන උපයෝජිත ව්‍යාපෘතියක් බවට පත්වී තිබුණි.

3.5 වාහන උපයෝජනය

සභාව සතු ඩබල් කැබ් රථයක් 2016 දෙසැම්බර් 31 දින අනතුරට ලක් වී තිබීම පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වාහනයට සිදු වූ අනතුර සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩල 04 ක් මගින් පරීක්ෂණ පවත්වා තිබුණද 2018 ජූලි 30 දිනය දක්වාම අනතුරට හේතුව හෝ ඊට වගකිවයුතු අය හඳුනාගෙන නොතිබූ අතර මුදල් රෙගුලාසි 104 ප්‍රකාර වාර්තාද ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවේ මුරකරුවකු වාහනයේ රියදුරු ලෙස කටයුතු කරමින් සිටියදී අනතුර සිදු වී තිබුණු අතර පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික ඉංජිනේරු විසින් ඉදිරිපත් කර තිබූ රු.1,557,709 ක් වූ ඇස්තමේන්තුව මත 2017 ජූනි 22 දින අළුත්වැඩියාව සිදු කර ගෙන තිබුණද සභාවට සිදු වූ පාඩුව අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.6 ප්‍රසම්පාදනය

බැල්ලපිටිය ළමා ක්‍රීඩාංගනය සඳහා රු.1,060,000 ක් ගෙවා මිලදී ගෙන තිබූ Play Station නැමති උපකරණ සැපයීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමේදී එම උපකරණ භාවිතා කළ හැකි වයස් සීමාව අවු.04-14 ලෙස දක්වා තිබුණද උපකරණය වෙනුවෙන් ලබාදී තිබූ වගකීම් සහතිකයේ එකී වයස් සීමාව අවු. 03-12 ලෙස සඳහන් කර තිබුණි.

4. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4:1 <u>අයවැය පාලනය</u>

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ අයවැයගත හා තථ්‍ය ආදායම් සියයට 95 සිට සියයට 140 දක්වාත් වියදම් සියයට 513 සිට සියයට 67 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. <u>පද්ධති හා පාලන</u>

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | ---------- | | ---------- |
| (අ) | ගිණුම්කරණය | (i) | ගිණුම්වලින් අත්හැරීම්, අඩුවෙන් හා වැඩියෙන් සටහන්වීම් තිබීම |
| | | (ii) | ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම |
| (ආ) | වත්කම් පාලනය | (i) | වත්කම්වල ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබීම |
| | | (ii) | වත්කම් නිසි පරිදි උපයෝජනය නොකිරීම |
| | | (iii) | නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත ව්‍යාපෘති පැවතීම. |
| (ඇ) | ආදායම් පාලනය | (i) | හිඟ බදු අයකරගැනීම් ප්‍රමාණවත් පරිදි සිදු නොවීම |
| | | (ii) | බදු තක්සේරු නියමිත කලට සිදු නොකිරීම |
| (ඈ) | මිලදී ගැනීම් | | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව මිලදී ගැනීම් සිදු නොකිරීම. |
| (ඉ) | අයවැය පාලනය | (i) | අයවැය හා තථ්‍ය වියදම් අතර විශාල විචලනයන් පැවතීම |
| | | (ii) | ආදායම් ඇස්තමේන්තු තාත්වික නොවීම |